**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණුකිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති - 1) 2015**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණුකිරීමේ ආයෝජන වැඩසටහනේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ආසියානු සංවර්ධන බැංකුව හා ලංකා විදුලිබල මණ්ඩලය අතර 2014 නොවැම්බර් 20 දින එළඹි අංක එස්ආර්අයි 47037 දරන ණය ගිවිසුම් II වගවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොතට අනුව විදුලිබල හා පුනර්ජනනීය ශක්ති අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ කාර්යක්ෂම හා විශ්වාසදායක ජලවිදුලි උත්පාදන පද්ධතියක් සම්පූර්ණ කිරීමය. ආයෝජන වැඩසටහනේ කොටසක් ලෙස පුනර්ජනනීය ශක්ති උත්පාදනය වැඩිකිරීම, උසස් සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සැපයීම, ජාල කාර්යක්ෂමතා වැඩිදියුණුකිරීම හා ඉල්ලුම්ගත කළමනාකරණය සහතික වීම ව්‍යාපෘති අභිප්‍රායන් වේ.

පහසුකම් පරිපාලන අත්පොතට අනුව වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 28,509.80 කට සමාන එ.ජ.ඩො. මිලියන 220 ක් වූ අතර ඉන් රු. මිලියන 23,325.50 කට සමාන එ.ජ.ඩො. මිලියන 180 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වැඩසටහනේ ව්‍යාපෘති - 01 යටතේ එකඟවී තිබුණි. මෙම වැඩසටහනේ කටයුතු 2014 නොවැම්බර් 20 දින ආරම්භ කළ අතර 2019 සැප්තැම්බර් 30 දින නිම කිරීමට අපේක්ෂිතය. මූල්‍ය ප්‍රභවයන්ගේ සාරාංශය පහත දැක්වේ.

| ප්‍රභවය | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව - සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් ණය | 121.00 | 15,680.40 |
| ආසියානු සංවර්ධන අරමුදල් ණය | 29.00 | 3,758.10 |
| වරලත් (Franchise) නියෝජිතායතන සංවර්ධන ණය | 30.00 | 3,887.00 |
| ශ්‍රී ලංකා රජය | 40.00 | 5,184.70 |
| | 220.00 | 28,510.20 |

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත්

පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

**(ආ)** ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමට පත්වන පරිදි සැසඳීම කර තිබුණේද යන බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

**(ඇ)** ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව සහ

**(ඌ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූයේද යන බව.

## 1.5 <u>තත්වාගණන විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාතීාවේ 2.2 ඡේදයෙන් දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

**(අ)** 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකාවේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1 <u>ගණකාධිකරණ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා උඩපළාත හා ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල නේවාසිකයින්ගෙන් අත්පත්කරගත් ඉඩම් සඳහා එකතුව කොටස් ගෙවීම් රු.මිලියන 6.20 ක් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ පෙන්නුම් කර තිබුණි.

(ආ) වෙනත් ආධාර මුදල් ව්‍යාපෘතියක් එනම් තිරසාර බලශක්ති ආංශික සහායක ව්‍යාපෘතිය යටතේ මොරගොල්ල ජලවිදුලි බලාගාරයේ විස්තරාත්මක නිර්මාණ සැලසුම් සඳහා 2014 වැයකල රු.මිලියන 1.37 ක් 2015 දී මෙම වැඩසටහනට මාරු කරන ලදී. තවද, ඉහත සඳහන් ආධාර අරමුදල් ව්‍යාපෘතියේ යන්ත්‍ර, දේපල හා උපකරණ ක්ෂයවීම් රු.මිලියන 2.94 ක් ද, සමාලෝචිත වර්ෂයේදී මෙම වැඩසටහනට මාරු කරන ලදී.

**2.2.2 <u>නීතිරීති, රෙගුලාසිවලට අනුකූල නොවීම</u>**

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව සමාලෝචිත වර්ෂයේ වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, ඒවා 2016 ජූනි 24 දින ඉදිරිපත් කර තිබුණි.

**3. <u>මූල්‍ය හා භෞතික කාර්යසාධනය</u>**

**3.1 <u>අරමුදල් උපයෝජනය</u>**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය තුල අයවැය ඇස්තමේන්තු මගින් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 180.00 | 23,326.20 | 4,361.00 | 0.80 | 110.00 | 0.80 | 110.00 |
| ශ්‍රී ලංකා රජය | 40.00 | 5,183.60 | - | - | - | - | - |
| ලංකා විදුලි බල මණ්ඩලය | - | - | 541.00 | 1.40 | 176.70 | 1.60 | 205.00 |
| එකතුව | 220.00 | 28,509.80 | 4,902.00 | 2.20 | 286.70 | 2.40 | 315.00 |

### 3.2 භෞතික ප්‍රගතිය

(අ) විගණනයට ලැබී ඇති තොරතුරු අනුව උපදේශකවරයෙකු තෝරාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් මොරගොල්ල ජලවිදුලි බලාගාරයේ කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුලත්වී මාස 13 කට පසුවවත් සිවිල් ඉදිකිරීමේ වැඩ ආරම්භ කර නොතිබුණි. තවද, 2014 නොවැම්බර් මස රු.මිලියන 6.20 ක් මොරගොල්ල ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇතත් ජල විදුලි බලාගාරයේ ඉඩම් අත්පත් කරගැනීමේ භෞතික ප්‍රගතිය විගණනයට ලැබී නොතිබුණි.

(ආ) Kappaiturel විදුලි උපපොල ඉදිකිරීම හා කෙරවලපිටිය, කටුනායක හා ත්‍රිකුණාමලය විදුලි උපපොල වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම්වලට 2015 දෙසැම්බර් 28 දින ඇතුලත්වී තිබුණු අතර වෙනත් වැඩ වන කැස්බෑව හා කළුතර විදුලි උපපොලේ ඉදිකිරීම් වැඩ හා යටිතල පහසුකම් වැඩිදියුණුකිරීම් යටතේ සම්ප්‍රේෂණ ධාරිතා වැඩිකිරීම, අනුරාධපුර පරණ හා නව විදුලි උපපොල වැඩිදියුණු කිරීම 2015 දෙසැම්බර් 31 දිනට ආරම්භක මට්ටමේ පැවතුණි.

(ඇ) වැඩ සටහනේ වෙනත් ක්‍රියාකාරකම් වන මධ්‍යම තරංග ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම, ශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ඉල්ලුම්ගත කළමනාකරණ වැඩිදියුණු කිරීම, වැඩසටහනේ ක්‍රියාකාරකම් ආරම්භ කර වසර 01 ට පසුවත් ආරම්භක මට්ටමේ පැවතුණි.

### 3.3 මූල්‍ය පාලනමය කරුණු

ආධාර අරමුදල් ව්‍යාපෘති වැඩිදියුණුකිරීම් සඳහා වෙනම අංශයක් ඇතිකිරීම වෙනුවට වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම ලංකා විදුලි බල මණ්ඩලයේ අංශ 3 කට වෙන්කොට පවරා තිබුණි. එමනිසා වැඩසටහනේ ක්‍රියාකාරකම් අධීක්ෂණයට නියම ක්‍රමවේදයක් හා භෞතික ප්‍රගතියේ තොරතුරු බෙදාහැරීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකර නොතිබුණි.